**ශීර්ෂය 140 - කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 140 - කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා` වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 පෙබරවාරි 15 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,146.47 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,056.88 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් රු.මිලියන 89.59 ක් හෙවත් සියයට 7.81 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 322.03 | 271.08 | 50.95 | 15.82 |
| මූලධන | 824.44 | 785.80 | 38.64 | 4.69 |
| **එකතුව** | **1,146.47** | **1,056.88** | **89.59** | **7.81** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 14001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12.50 | 6.62 | 6.00 | 7.42 | 40.00 | 21.23 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වූ පහත සඳහන් තැන්පත් ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 37.95 ක් විය.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0016/0082/000 | 26.04 |
| 6000/0000/00/0013/0088/000 | 11.91 |
| එකතුව | **37.95** |

## 2.4 විගණන නිරීක්ෂණය

කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනය පවත්වා නොතිබුණු බව විගණන පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වැය විෂයයන් 18 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ උපයෝජනයන් කළ පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 ක සිට සියයට 91 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ආ) වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.1,060,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) 2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව 2502 වැය විෂයය යටතේ ග්‍රාමීය ප්‍රදේශයන්හි ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩි දියුණු කිරිම සඳහා රු.මිලියන 200 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමෙහි ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් සඳහා රු. මිලියන 61.22 ක්ද අයභාර ස්වරූපයේ වියදම් සඳහා රු. මිලියන 56.63 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 117.85 ක් වැය කර තිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

විෂය අංක 14001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** 2015 දෙසැම්බර් 31 දින වන විට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් වර්ෂ 2 ක සිට වර්ෂ 11 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන එකතුව රු.253,143 ක ණය ශේෂ සම්බන්ධයෙන් 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.6 හා 1.1.7 ඡේද ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ)** ඉකුත් වර්ෂයේදී සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.107,896 ක් වූ ණය ශේෂය අයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කර 2016 ජූනි 10 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

## 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් රු.මිලියන 500.6 ක ඉදිකිරීම් සිදු කර තිබුණත්, අභ්‍යන්තර විගණන ඒකකය විසින් ඉන් සියයට 10 ක් වූ රු.මිලියන 48.9 ක ඉදිකිරීම් වටිනාකමක් පමණක් විගණනය කර තිබුණි.

### 3.4.2 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී වාහන පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය සතු වාහන 4 ක් විධිමත් ලෙස පවරා දීමකින් තොරව සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම විසින් පරිහරණය කර තිබුණි.

## 3.5 අනුකූල නොවීම්

**(අ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත දැක්වේ.

මුදල් රෙගුලාසි 755(1) හා 755(2) ප්‍රකාරව භාණ්ඩ භාර දීමේදී හා භාර ගැනීමේදි සියලුම රජයේ භාණ්ඩ හා වෙනත් දේපලවල තථ්‍ය තොග සමඟ ලෙජරයෙහි නැතහොත් බඩු ලේඛනයෙහි දැක්වෙන ශේෂයන් සසඳා පරීක්ෂා කර තුලනය කර භාර ගන්නා හා භාර දුන් නිලධාරියාගෙන් එම භාණ්ඩ භාර ගත් බවට හා භාර දුන් බවට කුවිතාන්සියක් ලබා ගත යුතු වුවත්, අමාත්‍යංශ සංශෝධනයේදී භාණඩ භාරදීමේදී හා භාර ගැනීමේදී ගැනීමේදී එසේ සිදු කර නොතිබුණි.

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

වැවිලි මානව සංවර්ධන භාරය විසින් ඉදිරිපත් කර තිබූ ඉන්වොයිසි 10 ක් වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු.4,204,044 ක් වූ එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි. එම ආයතනය 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2(අ) වගන්තිය ප්‍රකාරව එම බදු සඳහා ලියාපදිංචි අංකයක් ලබාගෙන නොතිබූ අතර, එලෙස ගෙවූ බදු සම්බන්ධයෙන් 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364(3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ජේදය ප්‍රකාරව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර ද නොතිබුණි.

## 3.6 දේශීය මුලාසකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 3.6.1 වැවිලි මානව සංවර්ධන භාරය මගින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

2010 වර්ෂයේ සිට ක්‍රියාත්මක වෙමින් පැවති හා වර්තමානයේ කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 03 ක කාර්යයන් වැවිලි මානව සංවර්ධන භාරය විසින් ඉටු කර තිබුණි. එම ව්‍යාපෘති කාර්යයන්ගෙන් වැඩි ප්‍රතිශතයක කාර්යයන් ව්‍යාපෘතිය ආරම්භයේ සිටම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂ 2ක සහ සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යාපෘති සඳහා වැවිලි මානව සංවර්ධන භාරයට පමණක් රු. මිලියන 1,259.28 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති තෝරා ගැනිම, ඒ සඳහා ප්‍රතිලාභින් හා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම ආදි කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණයෙන් තොරව වැවිලි මානව සංවර්ධන භාරය විසින් ඉටු කර තිබුණි. රාජ්‍ය මුදල් වැය කිරිමේදී අනුගමනය කළ යුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන් හා අනෙකුත් චක්‍රලේඛ අවශ්‍යතාවයන් අනුව කටයුතු කළ බව තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වැවිලි මානව සංවර්ධන භාරය රාජ්‍ය ආයතනයක්ද, පුද්ගලික ආයතනයක්ද යන්න තහවුරු කිරීමට එය පිහිටු වීමේ ගැසට් පත්‍රය අමාත්‍යාංශයේ හෝ එම ආයතනය තුළ හෝ නොමැති බව නිරීක්ෂණය වූ අතර, එම භාරය සමඟ අත්සන් කරන ලද ගිවිසුමක්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට ක්‍රියාත්මකව පැවති නව ජීවන වතු නිවාස සංවර්ධන වැඩසටහනෙහි ව්‍යාපෘතියක් යටතේ ලබාදී තිබුණු නිවාස ණය නැවත අයකර අමාත්‍යාංශය වෙත ලබාදීම එම වැඩසටහන සඳහා වූ මඟපෙන්වීම අනුව වැවිලි මානව සංවර්ධන භාරයේ වගකීමක් වුවද, එලෙස එකතුකරගත් මුදල්, අමාත්‍යාංශය වෙත භාරදීමකින් තොරව භාරයේ ගිණුම්වල රඳවා තබා ගෙන තිබුණි.

### 3.6.2 ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

ඉකුත් වර්ෂයේ එකතුව රු.1,542,684 ක්වූ සියයට 20 ක අත්තිකාරම් ගෙවා තිබු ව්‍යාපෘති 21 ක වැඩ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භකර නොතිබුණි. 2016 වර්ෂයේදී එම ව්‍යාපෘති සියල්ල අවලංගු කර නිකුත් කර තිබු අත්තිකාරම් වර්ෂ 1 1/2 කට අධික කාලයක් අත රඳවා තබා ගැනීමට ඉඩදී පසුව 2016 වර්ෂයේ ආරම්භ කළ වෙනත් ව්‍යාපෘති සඳහා හිලව්කර තිබුණි.

## 3.7 කාර්යසාධනය

නව ජීවන වතු නිවාස සංවර්ධන වැඩසටහන යටතේ වැවිලි මානව සංවර්ධන භාරයට ඉදි කිරීමට භාරදී තිබුණු 2015 දෙසැම්බර් 31 දිනට නිමකිරීමට සැලැසුම් කළ නිවාස 617 කින් නිවාස 100 ක් ආරම්භ කර නොතිබුණි. නිවාස 531 ක කටයුතු නිම කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව සැලැසුම් කළ නිවාසවලින් සියයට 16 ක කටයුතු ආරම්භ කර නොතිබුණු අතර සියයට 86 ක ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි.

**3.8 ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

ස්වයං රැකියා සැපයීමේ අරමුණෙන් වතුකරයේ තරුණ තරුණියන්ට ණය ලබාදීම පිණිස චක්‍රීය අරමුදලක් ඇති කිරීම සඳහා රාජ්‍ය බැංකුවක රු.මිලියනයක් තැන්පත් කිරීමට 2000 අගෝස්තු 24 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය වී තිබුණි. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2001 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසානය දක්වා කාලය තුළ අක්‍රියව පැවතුණි.

(ආ) 2004 වර්ෂයේදී අනුමත මුදල ඉක්මවා රු.300,000 ක් බැංකුවේ තැන්පත් කර තිබුණි.

(ඇ) චක්‍රිය අරමුදල යටතේ ලබා දුන් ණය ප්‍රමාණයන් ණය ලාභීන්ගෙන් අයකර ගැනීම් හා හිඟ හිටි ශේෂය පිළිබඳ විස්තර අදාළ බැංකු වෙතින් ලබාගෙන නොතිබුණි.

(ඈ) බැංකුව හා අමාත්‍යාංශය අතර 2001 වර්ෂයේදී ඇතිකර ගත් ගිවිසුමට අනුව ණය ලබාදීම බැංකුවේ නීති, රීතිවලට අනුව ඇප සහිතව ලබාදිය යුතු වුවත්, හිඟ ණය මුදල් ඇප මගින් හෝ අයකිරීමට බැංකුව විසින් උත්සහ කළ බවට කිසිදු සාක්ෂියක් නොතිබුණි. චක්‍රීය අරමුදල ආරම්භ කළ දින සිට 2013 ජනවාරි 30 දින වන විටත්, එම අරමුදලෙන් රු.4,223,343 ක හිඟ ණය හා පොලී ලෙස ගිණුමෙන් අයකර ගෙන තිබුණි.

**3.9 පාඩු හා හානි**

අමාත්‍ය මණ්ඩල සංශෝධනයට පෙර පැවති පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ රක්ෂණය කර තිබූ වාහනයක් 2015 පෙබරවාරි 01 දින අනතුරට ලක් වී තිබුණි. අමාත්‍යාංශයේ වාහන භාර නිලධාරියා විසින් සිදු වී තිබුණු රු.308,855 ක අලාභය ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා රක්ෂණ ආයතනයෙන් ඉල්ලුම් කිරීමට කටයුතු නොකර අදාළ ප්‍රතිපූර්ණය සඳහා ඉල්ලුම් නොකරන බව රක්ෂණ ආයතනයට දන්වා යවා තිබුණි. මේ නිසා වාහනය රක්ෂණය කිරීමෙන් අපේක්ෂා කළ අරමුණ ඉටු කර නොගැනීම නිසා රජයට පාඩුවක් වී තිබුණි. අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර එම අනතුර පිළිබඳව පොලීසියේ පැමිණිල්ලක්ද කර නොතිබුණි. 2015 වර්ෂය සඳහා ඉදිරිපත් කළ විසර්ජන ගිණුමේ එම අලාභය කපා හැරිය යුතු අලාභයක් ලෙස සඳහන් කර තිබුණි.

**3.10 කළමනාකරණ දූර්වලතා**

2006 ඔක්තෝබර් 27 දින මිලදීගත් රු.3,625,000 ක් වටිනා වාහනයක් 2010 නොවැම්බර් 11 දින ගංවතුරට යටවීම හේතුවෙන් අලුත්වැඩියා කිරීම සඳහා 2010 නොවැම්බර් 26 දින ගරාජයකට භාරදී තිබුණි. වාහනයේ අළුත් වැඩියා කටයුතු නියමිත ක්‍රියා පරිපාටියට අනුව සිදු නොකිරීම, 1999 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකිරීම හා අවශ්‍ය ආරක්ෂිත ක්‍රියාමාර්ග නොගැනීම යන හේතු නිසා රක්ෂිත හිමිකම රු.200,000 කට සීමාකර තිබුණි. වාහනයේ අළුත් වැඩියා කටයුතු නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් 2010 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා වාහනය ධාවනය කර නොතිබුණු අතර, වර්තමානයේද ධාවනයෙන් ඉවත් කර තිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**--------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 11 | 04 | - |
| (ii) | ප්‍රාථමික මට්ටම | 04 | - | 04 | - |
| (iii) | ද්විතියික මට්ටම | 293 | 277 | 16 | - |
| (iv) | තෘතීයික මට්ටම | 24 | 21 | 03 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | එකතුව | 336 | 310 | 27 | 01 |